JMC vLearning

"your virtual learning partner"

# මූල්‍ය ගිණුම්කරණය හා වාර්තාකරණය

සම්පත් ගනේපලආරච්චි

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

# නිර්වචනයන් (Definitions)

### සේවක ප්‍රතිලාභ

ව්‍යාපාරයක් විසින් එහි සේවකයන් විසින් සපයනු ලබන සේවාවට හුවමාරුවක් වශයෙන් ලබා දෙන්නා වු සියළුම ආකාරයේ ගෙවීම් වේ.

### කෙටිකාලීන සේවක ප්‍රතිලාභ

සේවකයන් අදාල සේවය සැපයීමේ කාලපරිච්ඡේදය අවසන් වී සම්පූර්ණ වශයෙන් මාස දොළහක කාලපරිච්ඡේදය ඇතුළත ගෙවිය යුතු වන (සේවක සමාප්ත කිරීමේ ප්‍රතිලාභ හැර) සේවක ප්‍රතිලාභ වේ.

### පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ

සේවා නියුක්තිය සම්පූර්ණ කිරීමෙන් පසු ගෙවිය යුතු වන (සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ සහ කෙටිකාලීන සේවක ප්‍රතිලාභ හැර) සේවක ප්‍රතිලාභ වේ.

### වෙනත් දිගුකාලීන සේවක ප්‍රතිලාභ

කෙටිකාලීන සේවක ප්‍රතිලාභ, පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සහ සේවක සමාපික කිරීමේ ප්‍රතිලාභ හැරුණු කොට අනෙකුත් සියළුම සේවක ප්‍රතිලාභ වේ.

### සේවක සමාප්ත කිරීමේ දී ගෙවනු ලබන ප්‍රතිලාභ

පහත සදහන් අවස්ථාවක ප්‍රතිඵලයක් ලෙස සේවක සමාප්ත කිරීමේ දී ගෙවිය යුතු වන සේවක ප්‍රතිලාභ වේ.

(i) සේවකයකුගේ සාමාන්‍ය විශ්‍රාම ගැන්වීමේ දිනයට කලින් සේවය සමාප්ත කිරීමට ව්‍යාපාරය විසින් ගත් තීරණයකදී හෝ

(ii) එම ප්‍රතිලාභ හුවමාරුවක් වශයෙන් ගෙන ස්වේච්ඡාවෙන් අතිරික්තකාව පිළිගෙන ඉවත් වීමට සේවකයා විසින් ගත් තීරණයක දී

## සේවක ප්‍රතිලාභ වර්ග

සේවක ප්‍රතිලාභ ප්‍රමිතය අනුව සේවක ප්‍රතිලාභ වර්ග හතරක් හදුනාගෙන ඇත. එම වර්ග හතර පහත සදහන් පරිදි වේ.

| සේවක ප්‍රතිලාභ වර්ග | | | |
|---|---|---|---|
| කෙටිකාලීන ප්‍රතිලාභ | පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ | වෙනත් දිගුකාලීන ප්‍රතිලාභ | සේවක සමාප්ත කිරීමේ ප්‍රතිලාභ |
| වැටුප් හා වේතන<br><br>සමාජ ආරක්ෂණදායක<br><br>ගෙවීම් සහිත වාර්ෂික නිවාඩු<br><br>ගෙවීම් සහිත අසනීප නිවාඩු<br><br>ගෙවීම් සහිත මාතෘත්ව/පීතෘත්ව නිවාඩු | විශ්‍රාම වැටුප්<br><br>පශ්චාත් සේවා නියුක්ති වෛද්‍ය පහසුකම්<br><br>පශ්චාත් සේවා නියුක්ති රක්ෂණාවරණ | දිගුකාලීන ගෙවීම් සහිත නොපැමිණීම් උදා - දීර්ඝ සේවා පඩි සහිත නිවාඩු සරසවි ඇදුරනට සෑම හත් වසරකට වරක් ලැබෙන පඩි සහිත නිවාඩු<br><br>සංවත්සරික හෝ අනෙකුත් දීර්ඝ සේවා ප්‍රතිලාභ<br><br>දීර්ඝ කාලීන දුබලතා ප්‍රතිලාභ | කලින් විශ්‍රාම යෑම් වලට අදාල ගෙවීම්<br><br>අතිරික්නතාව පළිගෙන ඉවත්වීමට සේවකයා විසින් ගත් තීරණයකට අදාල ගෙවීම් |


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

| | | | |
|---|---|---|---|
| ලාභ කොටස් ප්‍රසාද දීමනා<br><br>ගෙවීම් සහිත දිවුරුම් සේවා<br><br>ගෙවීම් සහිත යුධ හමුදාමය සේවා<br><br>මුල්‍ය නොවන ප්‍රතිලාභ<br>උදා - වෛද්‍ය පහසුකම් මෝටර් | | විලම්භිත පාරිශ්‍රමිකයන්<br><br>ලාභ බෙදාගැනීම් සහ ප්‍රසාද දීමනා | |

## හඳුනාගැනීම සහ මැනීම

### කෙටිකාලීන සේවක ප්‍රතිලාභ

කෙටිකාලීන සේවක ප්‍රතිලාභ සේවකයා විසින් සේවය සපයන ලද කාලපරිච්ඡේදයට අදාල සේවායෝජකගේ මුල්‍ය ප්‍රකාශන තුළ සේවක පිරිවැයක් ලෙස හඳුනාගත යුතුය.

ගිණුම්කරණ කාලපරිච්ඡේදයක් අවසානයේ දී නොගෙවා ඇති කෙටිකාලීන සේවක ප්‍රතිලාභ උපචිත වියදමක් ලෙස හඳුනාගත යුතුය. ඉදිරියට කළ කිසියම් කෙටිකාලීන ප්‍රතිලාභයක් වේ නම්, එය කළින් ගෙවීමක් ලෙස හඳුනාගත යුතුය.(උදාහරණයක් ලෙස එමගින් අනාගත ගෙවීම්වල හෝ මුදල් ආපසු ගෙවීම්වල අඩුවීමක් ඇතිවන්නේ නම්)

මෙම ප්‍රමිතය තුළ කෙටිකාලීන සේවක ප්‍රතිලාභ දෙවර්ගයක් හඳුනාගනී.

(i) කෙටිකාලීන නොපැමිණීම

(ii) ලාභ බෙදගැනීම සහ ප්‍රසාද දීමනා සැලසුම්

### කෙටිකාලීන නොපැමිණීයාව (Short Term Paid Absences)

කෙටිකාලීන නොපැමිණීයාව සඳහා වන වන්දි,

- අසමුච්චිත වන්දි හා
- සමුච්චිත වන්දි යනුවෙන් දෙයාකාරයකි.

### කෙටිකාලීන නොපැමිණීයාව සඳහා අසමුච්චිත වන්දි හිමිකම

ප්‍රවර්ථන කාලච්ඡේදයෙදී භාවිත නොකළේ නම් ඉදිරියට ගෙන යනු නොලැබේ. උදා - මාතෘත්වය හෝ පීතෘත්වය, (බහුලවම) අසනීප වීම හා ගෙවීම් සහිත දිවුරුම් සේවා

### කෙටිකාලීන නොපැමිණීයාව සඳහා සමුච්චිත වන්දි හිමිකම

ප්‍රවර්ථන කාලච්ඡේදයෙදී භාවිත නොකළේ නම් එය අනාගත/ඉදිරි කාලච්ඡේදයක් සඳහා ඉදිරියට ගෙන යනු ලැබේ.

උදා - ගෙවීම් සහිත විවේක නිවාඩු, එනම් කිසියම් වර්ෂයක භාවිත නොකළ විවේක නිවාඩු ඊළග වර්ෂය සඳහා ඉදිරියට ගෙනයා හැකිය.

මෙහිදී මෙම නොපැමිණීයාවට අදාල ප්‍රතිලාභ වියදමක් ලෙස හඳුනාගත යුතුය. එයට හේතුව වන්නේ සේවකයින් සේවා සැපයීම හේතුවෙන් සේවකයින් ගේ අනාගත වන්දි සඳහා හිමිකම ඉහළ යාමයි. නොපැමිණීම් වලට අදාල සමුච්චිත පිරිවැය මනිනු ලබන්නේ වාර්තාකරන කාලච්ඡේදය අවසානයේ සමුච්චිතව ඇති භාවිතා නොකළ හිමිකම්වල ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපාරය විසින් ගෙවීමට අපේක්ෂිත අතිරේක වටිනාකමක් වශයෙනි.

**උදාහරණ** - භාවිත නොකල විවේක නිවාඩු


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

සමාගමක් විසින් එහි සේවකයන්ට ගෙවීම් සහිත විවේක නිවාඩු සඳහා වාර්ෂික හිමිකමක් ලබාදෙනු ඇත. වර්ෂය අවසානයේ දී, භාවිතා නොකළ කිසියම් නිවාඩුවක් වේ නම් එම භාවිතා නොකළ නිවාඩු මාස 12 ක් දක්වා ඉදිරියට ගෙන යාමට සේවකයින්ට හිමිකම් ලබා දී තිබුණි.

2020 අවසානයේ දී සමාගමේ සේවකයින් විසින් භාවිතා නොකළ විවේක නිවාඩු 50 ක එකතුවක් ඉදිරියට ගෙනවිත් තිබුණි. සේවකයින්ට දිනකට රු.100/- බැගින් ගෙවනු ලැබේ.

ඔබ විසින්, ඉදිරියට ගෙනා භාවිතා නොකළ විවේක නිවාඩු සඳහා අදාල ගිණුම්කරණ සටහන් සඳහන් කරන්න.

**පිළිතුර**

හිමිකම ඇතිවන වර්ෂයේ දී, එනම් 2021 දී කෙටිකාලීන නොපැමිණීම සඳහා වන සමුච්චිත වන්දිය වියදමක් ලෙස හඳුනාගත යුතු අතර, ඊට අනුරූපීව උපචිත වියදමක් ලෙස හඳුනාගත යුතුය.(දින 50 ම ඊළඟ වර්ෂයේ දී නිවාඩු ලෙස ලබාගන්නේ නම්)

අදාල ප්‍රමාණය වනුයේ,

| | | | |
|---|---|---|---|
| භාවිතා නොකළ විවේක නිවාඩු | × | දිනක වැටුප | |
| 50 | × | 100 | = රු. 5,000 |

**උදාහරණ :15**

මීගමුව කොන්ත්‍රාත් සමාගමේ සේවකයින් 100 ක් සිටී සෑම සේවකයෙකුම වර්ෂයක් සඳහා ගෙවීම් සහිත වැඩකරන දින 05 ක අසනීප නිවාඩුවකට හිමිකම් කියන අතර, භාවිතා නොකළ අසනීප නිවාඩු අවුරුද්දක් දක්වා ඉදිරියට ගෙනයාමටද හිමිකම් කියනු ලැබේ. අසනීප නිවාඩු ලබාගත යුත්තේ අවසාන ලැබීම් ප්‍රථම නිකුතු ක්‍රමය යටතේය එනම් ප්‍රථමයෙන්ම ප්‍රවර්ථන නිවාඩු හිමිකමෙන් සහ දෙවනුව ඉදිරියට ගෙනා කිසියම් අසනීප නිවාඩු ශේෂයක් වේ. නම් එම හිමිකමෙන්ය

2020.03.31 දිනට භාවිතයට නොගත් සාමාන්‍ය නිවාඩු හිමිකම ((Average Unused Entitlement) සේවකයෙකුට දින දෙකකි. මීගමුව කොන්ත්‍රාත් සමාගම (ඉදිරිටත් පවත්වා ගැනීමට අපේක්ෂිත පසුගිය අත්දැකීම් මත පදනම්ව) 2020රැ2021 වර්ෂයේ දී සේවකයින් 92 ක් අසනීප නිවාඩු 05 ම හෝ ඊට අඩු ප්‍රමාණයක් ගනු ඇතැයිද ඉතිරි සේවකයින් 08 දෙනා සාමාන්‍යයෙන් දින 6.5 ක අසනීප නිවාඩු ගනු ඇතැයි ද අපේක්ෂිතය.

**ඔබ විසින්,**

2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අසනීප නිවාඩු සඳහා අවශ්‍ය ගිණුම්කරණ සටහන් යොදන්න.

**පිළිතුර**

2020.03.31 දිනට සමුච්චිතව පැවති ප්‍රයෝජනයට නොගත් හිමිකමේ ප්‍රතිඵලයක් ලෙස මීගමුව කොන්ත්‍රාත් සමාගම දින 12 ක් සඳහා අසනීප ගෙවීම් අතිරේකව ගෙවීමට අපේක්ෂිතය.

එනම් දින 1.5 × සේවකයින් 8 = දින 12 කි.

2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මීගමුව කොන්ත්‍රාත් සමාගම දින 12 කට සමාන අසනීප ගෙවීම් වටිනාකමින් වගකීමක් සහ ඊට අනුරූපී වියදමක් හඳුනාගත යුතුය.

**ලාභ බෙදාගැනීම සහ ප්‍රසාද දීමනා සැලසුම්**

ගිණුම්කරණ කාලච්ඡේදයක් අවසන් වී මාස 12 ක් ඇතුළත ගෙවිය යුතු ලාභ බෙදාගැනීම් සහ ප්‍රසාද දීමනා වියදමක් සහ වගකීමක් ලෙස හඳුනාගත යුත්තේ ව්‍යාපාරයට ප්‍රවර්ථන බැඳීමක් ඇතිවන්නේ ගෙවීම් කිරීමට හැර වෙනත් කිසිදු යථාර්ථවාදී විකල්පයක් නොමැති අවස්ථාවක දී පමණි. මෙය සාමාන්‍යයෙන් සිදුවන්නේ සේවායෝජක විසින් ලාභ බෙදාගැනීමට හෝ ප්‍රසාද දීමනාවට අදාල ලාභය හෝ අනෙකුත් කාර්ය සාධන මට්ටම හඳුනාගන්නේ නම් පමණි. වගකීමක් ලෙස මැනීමෙන් පිළිබිඹු වන්නේ, ඇතැම් සේවකයින් ප්‍රසාද දීමනා ලැබීමකින් තොරව ඉවත්ව යාම සිදුවිය හැකි හෙයිනි.

**උදාහරණ :16**

ලාභ බෙදාගැනීමේ සැලසුම්


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

කැන්ඩි ට්‍රේඩින් සමාගම, ලාභ බෙදාගැනීමේ සැලැස්මක් ක්‍රියාත්මක කරයි. එම සැලැස්ම යටතේ වර්ෂය තුළ සේවයෙන් ඉවත් නොවූ සේවකයින් සඳහා සමාගමේ 2020.03.31 අවසන් වාර්ෂික ශුද්ධ ලාභයෙන් 0.1% ක් සමාගම ගෙවනු ලැබේ. මේ නිසා සමාගමේ සේවක පිරිවැටුම 2020/2021 දී 2.5% දක්වා අඩුකිරීමට හැකිවෙතැයි සමාගම ඇස්තමේන්තු කර ඇත. 2020 ආරම්භයේ දී සිටි සේවකයින් 30 දෙනාගෙන් සේවකයන් 5 දෙනෙකු වෙනුවට නව සේවකයින් යොදවාගෙන ඇත.

**ඔබ විසින්,**

2021.03.31 දිනෙන් අවසන් වර්ෂයෙදී ලාභ කොටස ලෙස කැන්ඩි ට්‍රේඩින් සමාගම කවර පිරිවැයක් හඳුනාගත යුතුද?

**පිළිතුර**

කැන්ඩි ට්‍රේඩින් සමාගම එහි ශුද්ධ ලාභයෙන් 2.5% ක් වගකීමක් සහ වියදමක් ලෙස හඳුනාගත යුතුය

(30 - 5 = 25 × 0.1%)

**පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ**

බොහෝ සේවායෝජකයින් විසින් තම සේවකයින් සේවයෙන් ඉවත් වූ පසු ඔවුන්ට පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ ලබාදෙනු ලැබේ. ඉතාමත් බහුලව දක්නට ඇති උදාහරණයක් නම් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම වේ. පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලසුම් වර්ග දෙකකි. එනම්,

(i) නිර්වචිත දායක සැලසුම්

(ii) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්

පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ යෝජනා ක්‍රම බොහෝවිට හඳුන්වනු ලබන්නේ සැලසුම් ලෙසය. මෙම සැළැස්ම සඳහා සේවායෝජකගෙන් නිරන්තරයෙන් දායක ලැබෙන අතර (ඇතැම් අවස්ථාවන්හි ප්‍රවර්ථන සේවකයන්ගෙන්ද දායක ලැබේ) එම දායක මුදල් වත්කම්වල එනම් ව්‍යාපාර වස්තු තොග, කොටස් සහ වෙනත් ආයෝජනවල ආයෝජනය කරනු ලැබේ. සැලසුම් වත්කම් වල ආදායම (ලාභාංශ, පොලී) හෝ ඇතැම් සැලසුම් වත්කම් විකිණීමෙන් ලැබෙන මුදලින් පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ ගෙවනු ලැබේ.

**නිර්වචිත දායක සැලසුම්**

නිර්වචිත දායක සැලසුම් යනු ව්‍යාපාරයක් විසින් වෙනත් ව්‍යාපාරයකට (අරමුදලකට) ස්ථාවර දායක මුදලක් ගෙවනු ලබන සහ ප්‍රවර්ථන හා පූර්ව කාලච්ඡේදවල සේවය සඳහා සියළුම සේවක ප්‍රතිලාභ ගෙවීමට තරම් ප්‍රමාණවත් වත්කම් අරමුදල සතු නොවන්නේ නම් තවදුරටත් දායක මුදල් ගෙවීමට නීතිමය හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් ඇති නොවන පශ්චාත් සේවා සැලසුම් වේ.

**නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්**

නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් යනු නිර්වචිත දායක සැලසුම් හැර අනෙකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් වේ.

**නිර්වචිත දායක සැලසුම්**

නිර්වචිත දායක සැලසුම් යටතේ සේවා යෝජක (ප්‍රවර්ථන සේවකයින්ද ඇතුලත්ව) සෑම වර්ෂයකදීම දී ඇති හෝ නිර්වචිත ප්‍රමාණයකින් (Defined Amount) සැලැස්මට නිරන්තරයෙන් දායක ගෙවීමක් කරනු ලැබේ. එම දායක මුදල් ආයෝජනය කරනු ලබන අතර එම ආයෝජන කෙතරම් දුරට සාර්ථකව හෝ අසාර්ථකව ක්‍රියාත්මක වන්නේද යන්න මත පදනම්ව කලින් සිටි සේවකයින්ට ගෙවන පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභයේ තරම/ප්‍රමාණය තීරණය කෙරේ ආයෝජනය ඉතා හොඳින් ක්‍රියාත්මක වන්නේ නම් එය අඩුවෙන් ක්‍රියාත්මක වනවාට වඩා වැඩි ප්‍රතිලාභයක් සඳහා දායක වීමට සැලැස්මට හැකියාව ලැබේ.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd